# ශක්තිය

ප්‍රගතියේ ජනහඬ කැටුව එන පුවත්පත

තැපැල් කාර්යාලයේදී ලියාපදිංචි කරන ලදී *QD/79NEWS/2016*

වෙළුම 14 | කලාපය 05 | 2016 නොවැම්බර් / දෙසැම්බර් | මිල රු.20/-







# රවි ජනඅරගලය කැඳවයි

- ජනතාව ප්‍රකෝප කරයි
- ජාතික විරෝධතාවක් මතුවේ.
- රාජ්‍ය ඉඩම් කොම්පැනිවලට.
- බදු ජාලය බෙල්ල හිර කරයි.
- රැකියා විරහිත බව වැඩිවේ.
- වැට් බදු බෝම්බය පුපුරයි.

රවිගේ 2017 අයවැය එක් අතකින් පොදු ජනතාව ප්‍රකෝප කරවනු ඇතැයිද, තවත් අතකින් ජනතාවට පහර වදින අයවැය යෝජනා ආරක්ෂා කිරීමට ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් ගණනාවක්ම ඉදිරිපත් නොවනු ඇතැයි ද පාර්ලිමේන්තු ආලින්දයේ විවෘතවම කියනු ඇසෙන බව පාර්ලිමේන්තුවෙන් වාර්තා වේ.

පොදු ජනතාවගේ බෙල්ල හිරකරන බදු ජාලයකින් සැකසුනු 2017 අයවැය රවිගේ අවසාන අයවැය ද විය හැකිය. 2016 අයවැයට වඩා වෙනස් මුහුණුවරකින්ද මෙවර අයවැය සකසා ඇත. ඇයවැය යෝජනා පොදු ජනජීවිතය වනසන අතරම එය එක එල්ලේම නොපෙනෙන ලෙස විවිධාකාරයෙන් වෙස්ගන්වා ඇත. තවද 2016 අයවැයට වෙනස්ව කොම්පැනිවලින් සහ ඉහල පංතියෙන්ද වෙනදාට වඩා බදු ආදායම් ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. එහෙත් 2016 අයවැයෙහි දී ක්‍රියාත්මක නොකල එබඳු යෝජනා මෙන්ම මෙකී යෝජනාද රවීගේ අය වැය හමස් පෙට්ටියට යා හැකිය. දින 100 අතුරු අයවැයේදී ගෙනඑන ලද මන්දිර බද්ද ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොකල හැකි බද්දක් ලෙස අත්හැර දමනු ලැබීය. ඉහල පංතියෙන් බදු අයකර ගන්නා සෙසු යෝජනාවලටද එම කලදසාවම උදාවිය හැක. දේපොල විකිණීම් මත ලබන ලාභය මත බද්ද, කොටස් වෙළඳපොළේ සමාගම් විසින් ගන්නා ණයට ගෙවන පොලියට දුන් බදු නිදහස අහෝසි කිරීමද, ඉහල මට්ටමේ මුදල් ගණුදෙණුවලින් බැංකු හරහා ගැනීමට නියමිත බදු ආදිය සැබවින්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබුවහොත් එය පුදුමයට හේතුවනු ඇත. එහෙත් ඒ අතරම රවිගේ මුදල් ඇමති ධූරය ටඉහල පංතියෙන්ද, පොදු ජනතාවගෙන්ද එකවර විරෝධය නැගී ඒමට පුලුවන. රවිගේ පමණක් නොව ආණ්ඩුවේද අභාවයට හේතු විය හැකි ජනතා විරෝධයක් සෑම ජනකොටසක් අතරින්ම පැන නැගීමට අනන්තවත් හේතු ඇත.

▶ 2 පිටුවට

**අපි මේ යහපාලනය බලයට පත් කලේ මේ වගේ දූෂණ කරන්නද මේ විධියට ජනතාව මත බදුබර දමන්නදරෑ අපි කොන්ද කෙලින් තියාගෙන මේවාට විරුද්ධ වෙනවා.**

*පාර්ලිමේන්තුවේදී ජ.වි.පෙ. නායකයා*

**සහෝදරයා, එදා කොන්ද හයර් එකට දීල රනිල්ගේ ආණ්ඩුව පත් කරගෙන දැන් මොනවද මේ බොරු ආඩපාලි දොඩවන්නේ**



ශක්තිය

49 1/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස් / දුරකථනය: 011 2684820
විද්‍යුත් තැපැල : shakthiya85@gmail.com
වෙබ් අඩවිය : www.shakthiya.org

## යුදවැදී ආබාධිත වූ සෙබලුන්ට විශ්‍රාමය අහිමි කර පහරදීමේ යුක්තිය කුමක්ද?

සංහිඳියාවක් ඇති කර ගැනීම මුල් කර සියලු දෙනා එක්වී පැවති පාලනය වෙනස් කලේය. පාර්ලිමේන්තුව තුල සම්ප්‍රදායික පක්ෂ විපක්ෂ පිරිස් එක් විය. ඒ අතර නව ඒකාබද්ධ විපක්ෂයක් ද බිහි විය. මෙම බහුතර විපක්ෂය නොතකා හැර අත්තනෝමතික ලෙස රජය කටයුතු කරමින් පාලකයෝ සංහිඳියා පිලිවෙත පාර්ලිමේන්තුව ඇතුලතින්ම බිඳ දැම්මෝය. නව රජයේ අව ගමන එතැනින් ඇරඹුනි.

ප්‍රතිපත්ති ගරු නොකරන පාලකයෝ ලැබුනු අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් මැති ඇමතිකම් බෙදා ගෙන තම සුඛවිහරනය සඳහා කටයුතු කරති. ආබාධිත සෙබලු තමන්ට ලැබිය යුතු විශ්‍රාම වැටුප ලබා නොදීම ගැන පාලකයින්ගේ අවධානය සඳහා කරුණු දැක් වූවෝය. ලිපි ලීවෝය. දේශපාලකයින් පසුපස බඩගෑවෝය. අප රටේ ජාතික නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, ස්වෛරීභාවය ආරක්ෂා කර ගැනීම සඳහා ඇස්- හිස්- මස්- අවයව පරිත්‍යාග කරමින් බෙදුම්වාදී සතුරා පරාජය කළ සිය වීරත්වය සමාජය අභිමුවට ගෙන ඒමට අබාධිත සෙබලු තීරණය කලෝය.

පාලකයින් යුක්තිය මානුෂිකත්වය හා අයිතිවාසිකම මඟහරිමින් අබාධිත සෙබලුන්ට හිමි විශ්‍රාම වැටුප ලබා නොදීම ගැන කනස්සල්ලෙන් ඔවුහු කොටුව දුම්රියපොල ඉදිරිපිට වාඩිලා ගනිමින් තම සිරුරුවල අහිමි වූ කොටස් ජනාවගේ ඇස් පනාපිට අව් වැසි නොතකා ප්‍රදර්ශනය කරන්නට විය. එලෙස දින ගනනාවක් අහිංසක විරෝධතාවය දක්වන විට පාලකයින්ගේ පස්ස රත්වීම පටන් ගැනුනි. ආණ්ඩුවේ ප්‍රධාන ඇමතිවරයෙකු හා ජනාධිපති නියෝජනය කරන ශ්‍රී ල.නි.ප.යේ වර්තමානයේ මහා ලේකම්වරයා වූ දුමින්ද දිසානායක මහතා ආබාධිත සෙබලු ඉදිරියට පැමිණ ජනාධිපතිවරයාගේ අවධානය මේ පිලිබඳව යොමුවී ඇති බවත් මසක් ඇතුලත සියලු කටයුතු නිම කර දෙන බව දන්වා උද්ඝෝෂණය අත්හරින ලෙස ඉල්ලා සිටි බව පුවත්පත්වල ලොකු අකුරින් පළ විය.

දින සති විය. සති මාස විය. මාස හයකට වඩා වැඩි කාලයක් ගෙවී ඇතත් ඉල්ලීම් ඉටු නොවුනා පමණක් නොව ජනාධිපතිවරයා හෝ ඇමතිවරයා ඒ ගැන කරන දෙයක් අබාධිත සෙබලුන්ට නොපෙනී ගියේය. ඇත්ත හේතුව වූයේ ආර්ථික අගාධයකට පත්ව ඇති රජය ඒ වන විටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබා ගෙන ඇත්තේ රජයේ සේවක විශ්‍රාමය අහිමි කිරීමේ කොන්දේසිවලට යටත් වෙමිනි. එනිසා ආබාධිත සෙබලුන්ට විශ්‍රාමය ලබාදීම ජාත්‍යන්තතර ණය ගණුදෙනුවේ කොන්දේසි කැඩීමකි. අගමැති මුදල් ඇමති ඒ ගැන නිහඬය. ජනාධිපතිද ඔවුහු සමඟ සහජීවන පාලනය ගෙනයති. නීති වෙනස් කිරීම, ලිපි යැවීම, අනුමැතිය ගැනීම වැනි කථා ගොතමින් කල් මරණ බව ආබාධිත සෙබලු දැන ගෙන කුපිත වූහ. ඔවුහු නැවතත් සංවිධානය වී 'ජීවිතය නැත්නම් මරණය' යන දැඩි අධිෂ්ඨානයෙන් යුතුව තම දෙවැනි සටන් වාරය කොටුව දුම්රිය පොල ඉදිරියෙන් ඇරඹුනි.

දින එක දෙක තුන පසු විය. පොරොන්දු දුන් පාලකයෝ මඟහැරියෝය. කිසිවෙක් ඉදිරියට නොපැමිනෙන නිසා විසඳුමක් ලබා ගැනීමට දේශමාමක පුරවැසියන්ද එක්වී සංවිධානය විය. ඔවුහු සාමකාමීව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත උද්ඝෝෂණිකව ගමන් අරඹන විට නැවතත් පාලකයින්ගේ පසුපස රත්වීම පමණක් නොව දඩබල්ලන්ගේ කුඩු වල අඟුල් බුරුල් කෙරුණි. කුලු පොලු විස වායු සේනා ආයුධ සන්නද්ධව ආබාධිතයින්ට එරෙහිව පෙල ගැස්විය.

මෙවර ආණ්ඩුවේ යුද්ධය ඇරඹෙන්නේ බෙදුම්වාදයට එරෙහිව නොව යුතුකම, සාධාරණත්වය, මානුෂිකත්වයට එරෙහිවය. පාලකයින් හා දඩ බල්ලන් එක පෙලකය. ආබාධිතයින් හා යුක්තිගරුක පුරවැසියන් අනෙක් පසෙකය. පාලකයින් සමඟ සාකච්ඡාවට සම්බන්ධ වූ පිරිස පැය ගණනක් පසුවීත් නොපැමිණෙන විට, උද්ඝෝෂණ ඝෝෂාව තියුණු විය. ආබාධිතයින් විසුරුවා හරින ලෙස පාලකයින්ගෙන් අණ ලැබුණි. විස ගෑස් විසුරුණි. කුලු පොලු පහරවල් අබාධිතයින්ගේ ඉතිරිව ඇති සිරුරු කැබලි මත පතිත විය. බාධක හරස් කර විය. මහත් භීෂණයකින් පසුවද ජනබලය යටත් කරගත නොහැකිව අවසානයේ පාලකයෝ විශ්‍රාමය ලබා දීමට ජාත්‍යන්තර මුල්‍ය කොන්දේසි කඩකරමින් යටත් විය. අත්සන් කල පොරොන්දු ලිපියක් මහා සංඝයා ඉදිරියේ ආබාධිතයින් අතට භාර කලේය.

අන්ධයන්ට, අතපය නැති ආබාධිතයින්ට කඳුලු වායු විසුරුවා පහර දෙන්නේ මොන තිරිසනුන්ද යන පැනය හතරවටින් රජයට එල්ල විය. ඊට දින කීපයකට පසුව විදේශ චාරිකාවක සිට පැමිණි ජනාධිපතිවරයා පල කලේ ''තමන් රටේ සිටියා නම් ආබාධිත සෙබලුන්ට ලේකම් කාර්යාලයට පැමිණීමට ඉඩ සලසා ඔවුන්ගේ ප්‍රශ්ණය විසඳනවා. විපක්ෂ දේශපාලන පිරිස් අණ නොතකන විට ජල ප්‍රහාරයක් එල්කර තිබෙනවා.'' යනුවෙනි. ප්‍රධාන පුරවාසියාට, රාජ්‍ය නායකයාට මුකුත් නොදන්නා අයෙකු ලෙස දේශපාලන වාසියට මුවාවී කල් මැරීමට ඉඩදීම ගැන යහපාලනයකට පෙල ගැසුනු විද්වතුන්ගෙන් ජනතාව ප්‍රශ්ණ කිරීමට පටන් ගෙන තිබේ.

# පීඩිත ජනතා විමුක්තියට කැපවුනු පිදෙල් සහෝදරයා



පිදෙල් සහෝදරයාගේ අභාවය පිලිබඳව ප්‍රජාතනත්‍රවාදී වාමාංශික පෙරමුනේ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව සහෝදරයා විසින් නිකුත් කළ නිවේදනයේ මෙසේ සඳහන්වේ.

ෆිදෙල් ක්‍රස්තෝ සහෝදරයා කියුබානු විප්ලවයේ අසහාය නායකයා මෙන්ම වත්මන් ලෝකයේ සියලු ප්‍රගතිශීලී හා අධිරාජ්‍ය විරෝධී අරගලයෙහි අධ්‍යාත්මික නායකයා විය. කැස්ත්‍රෝ සහෝදරයා 1959 දී සිදුවූ කියුබානු විප්ලවයේ ප්‍රාතිහාර්යය පිටුපස සිටි ඓතිහාසික පුද්ගලයාය. වහල් මෙහෙය නිසා දුක්විඳිමින් සිටි අප්‍රිකානු සම්භවයක් සහිත ජනතාවගේ ජීවිත නගා සිටුවීමෙහිලා සමස්ථ ලෝකයටම සමාජවාදී කියුබාව ආදර්ශයක් විය.


සෝවියට් දේශය ප්‍රමුඛ සමජවාදී කඳවුර බිඳවැටීමෙන් පසු සමස්ථ ලෝකයේම ප්‍රගතිශීලී විමුක්ති අරගලයන් හට ප්‍රදීප ස්ථම්භයක් වු සමාජවාදී කියුබාව මුහුණදුන් එම ''විශේෂ කාලපරිච්ඡේදයෙහි'' පැවති ආර්ථික දුෂ්කරතාවයන් සාර්ථක ලෙස අභිභවනය කිරීමට ෆිදෙල්ගේ නායකත්වය තීරණාත්මක විය.

එදා සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර කියුබානු විප්ලවය රැකගත් ආරක්ෂක පවුර විය. එය බිඳවැටී වසර 25 ක් ගතවන මේ මොහොත වනතෙක් කියුබානු විප්ලවය ආරක්ෂාකර ගැනීම ආශ්චර්යමත් විය. එසේ කළ හැකි වූයේ සියළු ජනතාව විප්ලවීය ජීවගුණයකින් ඔදවත් කර ගැනීමෙන්ය. තවද ලෝකය පුරා විශේෂයෙන්ම ලතින් ඇමරිකාවේ සහ අප්‍රිකාවේ රෝගාබාධවලින් පීඩාවට පත් ලක්ෂ සංඛ්‍යාත දිලිඳු ජනකොටස් වෙත සහන සැලසු සෞඛ්‍ය හා වෛද්‍ය මෙහෙවර ෆිදෙල් සහෝදරයාගේම මානවවාදී කාරුණික ගුණය ඔස්සේ ක්‍රියාවට නැංවීමක් විය. ලෝකයපුරා ලක්ෂ ගණනකට ශිෂ්‍යත්ව ලබාදෙමින් වෛද්‍ය, ඉංජිනේරු, ක්‍රීඩා යනාදී ක්ෂේත්‍රවල වෘත්තීයවේදීන් බිහිකිරීමට කියුබාව වැනි කුඩා රටකට හැකිවීම අදහාගැනීමට පවා අපහසු කරුණකි.

## රවී ජන අරගලය.... 1 පිටුවෙන් >>

පොදු ජනතාවට, හා වැටුප් වලින් ජීවත්වන පවුල් වලටද, සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට සහ තරුණ පරපුරටද බදුබර එක් අතකින්ය. රුපියල පහල වැටීමේ බර තවත් අතකින්ය. එනිසාම සහ රජයේම තීරණ මත වැඩි වන ණයබර තවත් අතකින්ය. රැකියා විරහිතභාවය වැඩිවීම නිසා උග්‍රවන අර්බුදය තවත් අතකින්ය. උසස් අධ්‍යාපනයට තිබූ බාහිර ඉඩකඩ ඇහිරීම නිසා දැරීමට සිදුවන අධික වියදම තවත් අතකින්ය. පොහොර සහනය, විශ්‍රාමය, සහතික මිල ක්‍රමය ආදී සහන කපාදැමීම නිසා වැඩිවන වියදමද ජනතාව දරාගත යුතුය. රු. 41,000/= කට අඩු මාසික ආදායමක් ලබන 60% පමණ වූ පවුල්වලට මෙවැනි ඉරණමක් අත් වෙද්දී, කොම්පැනිවලට අක්කර එක්දහස බැගින් දීමට යෝජනා කරන්නේ කොබ්බෑකඩුව ශ්‍රීමතාණන් හඳුන්වාදුන් අක්කර 50 සීමාව බිඳ දමා කොලනි ගොවියන්ගේ දෙවන තුන්වන පරම්පරාවන් ඉඩම් විරහිතව සිටියදීය.

මේ සමගම අධ්‍යාපනයට, සෞඛ්‍යයට, කෘෂිකර්මයට, සමාජ සුභ සාධනයට ආදී ජන ජීවිතයට ඉතා වැදගත් අංශවලට වෙන්කල මුදල් සැලකිය යුතු ලෙස අඩුකර ඇත. රවිගේ අයවැය කථාවේ ඔහු කාල බෝම්බයක් ගැන කථා කළේය. ආණ්ඩුවේ ශ්‍රී.ල.නි. පක්ෂ මැතිඇමතිවරුන් විසින් මෙම අයවැයෙහි ඇති ජනතා විරෝධී රළු ගතිය ලිහිල් කිරීමට උත්සාහ කලත් මෙබඳු කාලයක එය එක් සීමාවකට වඩා නොකල හැකිය. අයවැය ඉදිරිපත් කිරීමට පෙර පැනවූ VAT - NBT ආදී බදු අයකිරීම්ද අය වැයට එකතු වූ විට කාල බෝම්බයේ කූර ගැලවී රවිත් ආණ්ඩුවත් පුපුරායාමට ඉඩ ඇත. එනිසා ඒ ගැන බියෙන් ධනපති සමාගම් තමත් වෙත පැටවූ බදුබර පොදු ජනතාව වෙත බැර නොකර සිටීමට බැරිතරම් ලාභයේ කෑදරකමින් දැවෙමින් සිටී.




# අඬවැඩියා ආණ්ඩුවේ ඉදිරිය අවිනිශ්චිතයි.

දීර්ඝ ගිනියම අවසන් කර වර්ෂාව දිවයින තෙත් බරිත කරයි. ඇතැම් ප්‍රදේශවලට ඉල්මසේ අහස හිල්වී දෝරේ ගලයි. තැන් තැන්වල ගංවතුර තර්ජනයත්, නායායෑමේ අනතුරුත් දැකිය හැකිව තිබේ. ජලාශ පිරී ඉතිරී යන බැවින් විදුලිය නිෂ්පදනය උපරිමක රැඳවී රජය ලාබ ලබයි. වගාවන් හානිවී අසරණව සිටි ගොවියෝ යුහුසුලු වගාවට යොමු වෙති. බවභෝග එල දරා පරිසරයේ වෙනස ජනතාවගේ මනසට බලපෑම් කරයි. බොහෝ අය වත්ත පිටිය දෙසට වැඩි කාලයක් යොමු කරන බැවින් ආණ්ඩුවට එරෙහි උද්ඝෝෂණ පරිසර හේතුව නිසා තාවකාලිකව යටයයි. පාලකයෝ යුහුසුළුව තමන්ගේ පැවැත්මට වාසි සහගත යෝජනා ලහි ලහියේ සම්මත කර ගැනීමට උත්සුකව සිටිති. ජනතාව අවදිව මේවා දෙස නැවත බලන්නේ නත්තලෙන් පසුව දුරුත්තේදීය. වැහි අඳුර දුරු කර සීත සළුපිලි වලින් සැරසී සාමයේ කුමරා සැමගේ සිත් තුලට සැපත්වන අයුරු උඳුවප් පෝයෙන් පසුව දැක බලා ගතහැකිය.

## රනිල් හෙනහුරු සන්නියට සැරසේ.

මෙවර අයවැය දෙස විශ්ලේෂනාත්මකව කරුණු හදාරණ අයෙකුට පෙනී යන්නේ එය පොදු ජනතාවගේ ඉහට උඩින් කඩා හැලෙන කඳු නායායෑමක් ලෙසය. එයින් සිදු වන විනාශය විග්‍රහ කල හැක්කේ අවට බලා සිටින අයට පමනය. එක් අතකින් ගොවි ජනතාවගේ ජන ජීවිතය කඩා බිඳ දමා ඔවුන්ගේ වතුපිටි කොල්ල කා බහුජාතික සමාගම් ජාලයට කෘෂිකර්මය දොරදන්දීමට සැරසේ. ගේදොර උගස්වී මහ මගට ගාල්වෙන ගොවි තරුණ තරුණියන් සමාගම්වල අඩුකුලී ශ්‍රම වහලුන් බවට පත් කෙරෙන සැලැස්මක් දියත් කරමින් තිබේ. ජේ.ආර්.ගේ විවෘත ආර්ථික සැලැස්ම අනුව තරුණ තරුණියන් නිදහස් වෙළඳකලාප වලට ගාල් කලත් ඔවුන්ගේ ගම්බිම්වල ඉඩම් කඩම්වලට ගොවිතැනට, සංස්කෘතියට හා සහජීවනයට අත පෙව්වේ සීරුවෙනි. එයින් පසුවත් ගම්බිම්වල සිදු වූ විනාශය නිසා කදුරුගෙඩි කා දිවි නසා ගන්නා තක්කාලි, ගර්කින් වැවූ ගොවි ජනතාව අතරින් ගොවි තරුණ කැරැල්ලක් උතුරේත් දකුනෙත් ඇවිලී ගියේය. එයින් සැමටම ධර්මිෂ්ඨ රාජ්‍යයේ කෙරුවාව පෙනී ගියේය. එවකට ජේ.ආර්.ගේ ඝාතක කල්ලියේ ප්‍රමුඛයෙක් ලෙස බටලන්ද මෙහෙයවූ තරුණ නායකයා අද බලගතු රාජ්‍ය පාලකයෙකි. එපමණක් නොව ඔහු යූ.ඇන්.පි.යේද පාලකයාය. එදා කඩම්බාල්දු වී බොඳවී ගිය ජේ.ආර්.ගේ සිංගප්පූරු බූරු සිහින මායා මාවතේ තුන්වෙනි පරම්පරාවේ නිර්මාපකයා ලෙස ඔහු තමන්ම හඳුන්වා ගනිමින් ඉදිරියට පැමිණ ඇත. සමාජ දේපොල බහුජාතික කොම්පැනිවලට පවරා දෙන බටහිර ගැති පියවරකින් සමාජ වෙළඳ පොලක් හදන බවට වහසි බස් දොඩයි. නමුත් එදා ජේ.ආර්. යුගයේදී සිදු කළ ආකරයෙන්වත් මෙදා ඔවුන්ට සිදු කිරීමට කිසිවක් ඉතිරි නොවන බව බටහිර ලෝකයේ සිදුවන පෙරලියෙන් පෙන්නුම් කරයි. ඔවුන්ගේ සිහින මාවතේ රන්දෙවොල දෙදරුම්කවමින් වොෂින්ටනයේ කොත් කැරැල්ල පසුගිය ජනාධිපතිවරණයේ ප්‍රතිඵලයත් සමඟ කැඩී බිඳී සුනුවිසුනු වී තිබේ.




## ජනමත - ඡන්දය "නක්සලයිට්" ක්‍රමයට

ජනපති-අගමැති එක්සත්වී ජනතාවගේ ඡන්ද අයිතිය පමණක් නොව මේ වන විට නිදහස් මාධ්‍යයටද බලපෑම් කරමින් සිටී. නීතියට පිටින් කටයුතු කළ බව දක්වමින් එක් රූපවාහිනී නාලිකාවක් තහනම් කර තිබේ. තවත් ආයතනයක් විමර්ෂණයට ලක් කරමින් තිබේ. පුවත්පත් කීපයකට දෝෂාරෝපනයන් එල්ල කරයි. බිය වද්දයි. නිදහස් ජන මාධ්‍ය කම්බස්කර තම පාලනයේ හොරණෑවන් බවට පත් කර ගැනීමේ ජේ.ආර්. අදමිටු උපාය නැවතත් ක්‍රියාත්මක වෙන බවට ජනතාව තුල සැක සාංකා මතු වෙමින් තිබේ. එපමණක් ද නොව එදා ජනමාධ්‍ය නිහඬ කර ව්‍යවස්ථා වෙනසක් කරන බව දක්වමින් රීනියා ප්‍රෝඩාකාරී ජනමතයක් පවත්වා ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතිය උදුරා ගත් ආකාරය මතකය. දැනුදු ජනාධිපති ධූරය අහෝසි කර කොට්ඨාශවලට බලය පැවරෙන ඡන්ද ක්‍රමයක් හා රට නොබෙදෙන බලය බෙදන ව්‍යවස්ථාවක් ඇති කරන බව කියමින් ජනතාවගේ ඇස් වලට වැලි ගසා ජාතික ස්වාධීනත්වය, නිදහස හා ප්‍රජාතන්ත්‍රය වලලන ජනමත විචාරණයකට ගමන් කිරීමේ සූදානමක්ද පෙනෙන්නට තිබේ. තවමත් අඩුවකට ඇත්තේ ජාතිවාදය උසි ගන්වා විපක්ෂ සටන්කාමී නායකයින් අත්අඩංගුවට ගෙන ජන මතයට පෙර හිර කර තැබීම පමණය. ජේ.ආර්. එදා කලේ නක්සලයිට් චෝදනාව එල්ල කරමින් විජය කුමාරණතුංග ඇතුලු ශ්‍රී ල.නි.ප. සටන්කාමී පිරිස හිරකර ජනමතය දිනුවේය. රජය නැවතත් එවැනි ''ධර්මිෂ්ඨ'' යුගයේ පැරණි උපාය පාවිච්චි කිරීමට සැරසුනොත් එයටත් ජනතාව සූදානම් කිරීම ඒකාබද්ධ විපක්ෂයේ වගකීමක් වේ.

## ජනතාව මඩවා කොම්පැනි ආර්ථිකය සවිකරදීම

ජේ.ආර්. ජනාධිපති ඇති කරන ලද විවෘත ආර්ථිකය සමාජය වෙලා ගෙන තිබේ. ජනතාවගේ සුභසාධනය වනසන වෘදධි යාන්ත්‍රණය බවට එය පත් කිරීමට වර්තමාන පාලකයෝ දඟලති. ඔහුගේ අනෙක් නිර්මානය වූ ඒකාධිපති ව්‍යවස්ථාව රටත් ජනතාවත් බෙදා වෙන් කරන දුෂ්ඨ අවියක් බවට පත් විය. යුද්ධය නිම වුවත් සමාදානයක් ඇති නොවුනේ ඒ නිසයි. ජේ.ආර්.ගේ අනෙක් දුර්දාන්ත පියවර වූ මනාප ඡන්ද ක්‍රමය ප්‍රජාතන්ත්‍රය වනසා ජනතා නියෝජිතයින් මැරයින් තක්කඩියන් හා දේපොල මංකොල්ලකන දුෂ්ඨ ව්‍යාපාරික වෘක රැලක් බවට පත් කලේය. ජනතාවට දේශපාලනය මෙන්ම ජනතා නියෝජිතයාද දුරස් කලේය. ජනතාව විසින් ඡන්දයෙන් පරාජය කළත් ව්‍යවස්ථාවේ පිහිටෙන් නැවතත් ඔවුන් අමාත්‍යවරුන් ලෙස පත්වී වහසිබස් දොඩමින් ජනතා මතයට අවමන් කිරීම මොනතරම් නවනින්දාවක්ද?

## විශ්‍රාමය - අර්ථසාධකය රනිල්, රවි උලාකයි.

රනිල් - රවි සැලැස්ම අනුව සමාජ වෙළඳ පොලට මුදල් සොයා ගන්න යන්නේ ආර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල ඒකාබද්ධ කර හදන විශ්‍රාම අරමුදලිනි. එයට රජයේ සේවක දායක විශ්‍රාමයත් එකතු කර ඔවුන්ගේ ධනපති සමාජ වෙළඳපොලේ සමාගම්වලට ව්‍යාපාර කිරීමට මුදල් පොම්ප කිරීමට කල්පනා කරන්නේ ශ්‍රමිකයින්ගේ මහලු විය ආරක්ෂාව සඳහා පවතින අරමුදල් වලින්. අවසානයේදී මොවුන්ගේ ක්‍රියාකලාපය නිසා රජයේ සේවකයාටත් පුද්ගලික අංශයේ කම්කරුවාටත් මහමග මියැදෙන්නට වන්නේ කිසිවෙකුගේ හවුහරනක් නොමැතිවය. වසර පහකට පාලනය භාරගත් මොවුහු වැඩකරන ජනතාවගේ සක්‍රීය ජීවිත කාලය පමණක් නොව මහලු වියද දරුපවුල්වල ජීවිතද මහ මඟට ඇද දමන පිලිවෙතකට පදනම දමමින් සිටිති.

## ජනපතිට නියවන අගමැති

මහ බැංකු අධිපති ලෙස පත් කළ අර්ජුන් මහෙන්ද්‍රන් හා ඔහුගේ බෑනාගේ සමාගම එක්වී මහබැංකුව සිදු කළ මහා පරිමාණ කොල්ලකෑම ලොවටම හෙලිවී හමාරය. එම සිද්ධිය පාර්ලිමේන්තු කෝප් කමිටුව විසින්ද තහවුරු කර ඇති අතර වරද සිදු කිරීමට එක්වීම හා වරදට පෙළඹවීම යන කරුණු දෙකෙන්ම රාජ්‍ය බලයේ ආවරණයෙන් කිසිවෙකුටත් බේරී සිටීමට ජනතා අධිකරණය කිසිදු ඉඩක් නොතැබිය යුතුය. මහජන දේපොල අවභාවිතය ගැන විපක්ෂයේ අය අත් අඩංගුවට ගෙන ප්‍රශ්ණ කරන ආකාරයෙන් කටයුතු නොකිරීමේ හේතුව කුමක්ද? තමන් පාලන බලය අල්ලා ගෙන සිටීම සුදුසුකමක් ලෙස සලකාගෙන කටයුතු කිරීමද? නීතියේ ආධිපත්‍ය පුද්ගල බලවත්මකට යටකිරීමට ඉඩකඩක් තිබේද? මෙය කුමන වර්ගයේ සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයක්ද? යන කරුණු ජනතාව අතර ප්‍රශ්ණගතව පවතී. පාලකයින් මාරු කිරීමට හෝ ජන මතය උරගා පෙන්වීමට තිබූ පළාත් පාලන ඡන්ද නැත. ස්වාධීන ආයතන පිහිටුවා යහපාලනයක් ගෙන යන බවට ජනතාව ඉදිරියේ පොරොන්දු වී බලය ලබා ගත්තත් පත් කළ ආයතන ස්වාධීනත්වයක් නොමැතිව පක්ෂපාතිව කටයුතු කරයි. පොදු ජනතාව ඉදිරියේ යහපාලනයක් ගෙනයන බවට පොරොන්දු වී ජන වරම ලබා ගත් ජනාධිපතිවරයාට නියවමින් අගමැතිවරයා ලෙස පත්වූ අය කරන විගඩම කුමක්ද? මෙයට ඉඩදී ජනතාවගේ නියෝජිතයා ලෙස ජනාධිපති බලා සිටිනවාද? එසේ නොමැති නම් ජනතාව වෙනුවෙන් තීරණයකට එළඹෙනවාද? මොවුන්ගේ හොරකම් නිසා ජනතාව පිට බදු පිට බදු පටවා ගෙන යන අව පාලනය ගැන ජනතාවගේ හදවත් තුල බුර බුරා නගින බලවත් කෝපය උත්සන්න වෙමින් තිබේ.

## හඬාවැලපෙන දොන් ජුවන් පාලනය

ජනාධිපතිවරයා දැනට සිදු කරමින් සිටින්නේ දුක් ගන්නාරාලගේ තනතුරේ කටයුතුය. හැමෝම පැමිණ ඔහු ඉදිරියේ හඬා වැලපේ. ජනාධිපති ජනතාව ඉදිරියට පැමින පැරණි යමක් කියා හෝ තමා නොදැනුවත්ව කරුණු සිදු වී ඇති බව හුවා දක්වා තම හදවතින් පැනනගින හඬාවැටීමේ දෝංකාරය සමාජය වෙත මුදා හරිමින් අනුකම්පාව දිනා ගනී. එනිසා රටත් ජනතාවත් ''ඔහෙ පලයං'' න්‍යායට හුරු කරමින් සිටී. මෑතක සිට ජනාධිපති ඉදිරියේ හඬා වැලපෙන්නේ අගමැතිය. මහජන දේපොල කොල්ල කෑ ඔහුගේ ගජ මිතුරන්ය. දැනට ජනපති සිදු කරන්නේ ඔවුන්ගේ ඔලුව අතගා පිටට තට්ටු කර සනසා ප්‍රශ්ණය යට ගැසීමය. ඒ අතර ඇමරිකන් යුද්ධ නැව් ත්‍රිමලයේ සැරිසරමින් අභ්‍යාස කරයි. ජනතාවගේ ඉඩකඩම් දේපොල විදේශිකයින්ට පාවා දීමට සැරසෙයි. සේවකයින්ගේ අරමුදල් අනාරක්ෂිත කරයි. විදේශික බෙදුම්වාදී බලවේග රට බෙදීමට මාන බලයි. දැන් යහ පාලනයක් නැත. ක්‍රියාත්මක වෙමින් ඇත්තේ එදා විදේශික බලවේග විසින් අටවනු ලැබූ දොන් ජුවන් ධර්මපාලගේ පාලනය මෙන් වූ රූකඩ ආණ්ඩුවකි. ජනාධිපති තුමා තැනේ හැටියට ලෙස්සමින් කට ගසා බේරී යමින් තිබේ. මෙවැනි දෙගොඩ දෙවාරේ පාලනයක් තුලින් සිදුවන්නේ ජනතාවත් සුං, ජනතාවගේ දේපොලත් සුං, අවසානයේ රටත් සුන්වී යන අභාග්‍ය සම්පන්න තත්වයකි.

සිරිසුමන විදානපතිරන
2016-11-22

# බදු ජාලයකින් පොදු ජනතාවගේ බෙල්ල හිරකරන අයවැයක්

## පාර්ලිමේන්තු සභාගැබෙන් ඇසෙන හඬ




2017 ඉහල පංතියටද බදු දමන මුවාවෙන් පොදු ජනතාව මත ඉතිහාසයේ නොවූ විරූ බදු බරක් අයවැයෙන් හා අයවැයට පිටින් දමා තිබේ.

2017 ජනතාවගෙන් වැඩිපුර රුපියල් බිලියන 155 එකතු කිරීමට නියමිතයි. ඉහල පංතියෙන් රුපියල් බිලියන 65 බදු ආදායමක් අපේක්ෂිතයි. බදුසහන ආදියෙන් ඔවුන්ට රුපියල් බිලියන 100ක් ආපසු ලබාදීමට නියමිතයි. කම්කරු නීති ලිහා දමා හාම්පුතුන්ගේ බලය වැඩිකරයි. මෑන් පවර් සේවක ස්ථිර කිරීම ගැන 2016 දුන් පොරොන්දුව ලිස්සා යවා ඇත.

**එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය**

ඒ අනුව බදු ප්‍රතිපත්තිය හා ආර්ථික සැලසුම පහලට ආදායම් නැවත බෙදීයන ලෙස විය යුතුය. නමුත් මේ රජයේ ප්‍රතිපත්තිය අනුව එය සිදුවන්නේ උඩු යටිකුරුවයි. පහලින් ඉහලට ආදායම් එකතු කර ඒකරාශී වන ලෙසටයි. නමට පමණක් තිරසාර සංවර්ධනය යොදනවා. මේවායින් රටත්, ජනතාවත්, ලෝකයත් රැවටිය හැකිද?

**බදු කයිවාරුව හා කෙරුවාව**

| | වක්‍ර බදු | සෘජු බදු |
|---|---|---|
| 2014 | 80 | 20 |
| 2015/16 | 84 | 16 ඉක්මවයි. |
| 2017 | 87 | 13 විය හැකියි. |

**දකුණු ආසියානු කලාපයේ බදු ප්‍රතිපත්තිය - 2016 උධෘතයකි.**

| | වක්‍ර බදු | සෘජු බදු |
|---|---|---|
| ඉන්දියාව | 65 | 35 |
| බංගලාදේශය | 70 | 30 |
| ලංකාව | 84 | 16 |

සිව් දෙනෙකුගෙන් යුත් පවුලකට අත්‍යවශ්‍ය වියදම

රු. **41,000 /=**

ඒ තුල වැට් හා ජා.ගො.නැ.බද්ධ රු.4756/- කි.(ජන හා සං.ලේ. දෙපාර්තමේන්තුව )

වක්‍ර බදු වැඩිවීම නිසා 60% ක පමණ ජනතාවගේ ජීවන මට්ටම් තවත් පහලට යාම නොවැලැක්විය හැකියි. රු.41, 000 /= ක පමණ මාසික ආදායමකින් යැපෙන පවුලක් VAT බදු සහ NBT (Thresh hold) බදු මට්ටම නිසා එම වියදම තුල රු. 4756/= ක් බදු විය හැකිය.

**ජනතාවට දුන් සහනය මුලාවක්**

බඩු භාණ්ඩ ගණනාවක අඩුකල මිල එකතු කළ විට රු. 68/= යි. එක මොබයිල් සිම් එකකින් රු. 200/= ක් බදු ගනියි. දුරකථන ගාස්තු වියදම 50%ක් වැඩි වෙයි. අතිරේකව රේගු බදු නිෂ්පාදන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බදු, වරාය බදු, සුරා බදු ඇතුළු සෙසු බදු හරහා පොදු ජනතාවගේ සම්පත් රජය විසින් අයුතු ලෙස පැහැර ගැනීමක් සිදුවේ.

**මුදල් ඇමතිවරයාගේ ලොකුම රුදාව**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උවමනාව අනුව අයවැය හිගය ද.දේ.නි.යෙන් 4.6% ට ගෙන ඒම මුදල් ඇමතිගේ ලොකුම රුදාවයි.

2017 අත්‍යවශ්‍ය වියදම් කප්පාදුවට සැරසීම මේ අයවැයෙන් පෙනේ. වැඩි ගණනක් අමාත්‍යාංශවල වියදම් ප්‍රතිශතයක් ලෙස කපා තිබේ. රු. බිලියන (ප්‍රකෝටි) 730 ක් රජයේ වියදම කපලා. 2017 බදු කන්දරාවකට යට කල ජනතාව වෙනුවෙන් කරන වියදම් තමයි මේ කපලා තියෙන්නේ.

බාහිර උපාධි නැති කිරීම ආදියෙන් ආණ්ඩුවේ වියදම් කැපීමෙන් දුප්පත් සිසුන්ට සමාන අවස්ථා ලැබීම අහුරා දැමීම සිදුවේ. ආණ්ඩුවේ ඇබෑර්තු දහස් ගණනකි. ඒවා පුරවන්නේ නැත. උපාධිධාරීන් රැකියා විරහිතව ලතවේ.

අධ්‍යාපන 59% - සෞඛ්‍ය 7.5% - සමාජ සුභසාධනය- 7.5% සුභ සාධනයට-

කෘෂි කර්මාන්තය 60.5% - කුසලතා පුහුණු 30% කපා දමා ඇත. මීට අමතරව යටිතල සංවර්ධන අමාත්‍යාංශ වියදම්ද කපා ඇත. උසස් අධ්‍යාපනය පුද්ගලිකරණය කිරීම පසුබිම් කරගෙන කප්පාදුව දියත් කර තිබේ.

හාල් කිලෝ 5 ක් දීලා එහි මිලත් සමෘද්ධියෙන් කපාගනු ඇත.

**ඩිජිටල්කරණ ප්‍රෝඩාව අයවැය පුරාම කියවේ**

රාජ්‍ය යන්ත්‍රය ඩිජිටල් කරණය කිරීමට රුපියල් මිලියන දහස් ගණනින්ද, පොලිසියේ ධාරිතාව වැඩි කිරීමට රු. මිලියන 5000/= ක්ද, වෙන් කරලා. නමුත් ග්‍රාමීය මාර්ග කිලෝ මීටර් 1000ක් සඳහා රුපියල් බිලියන 4500/= යි වෙන් කරලා තිබෙන්නේ.

ඩිජිටල් කිරීමට බටහිරින් දෙන ණය නැවත බටහිර සමාගම් වලට ඒ මාර්ගයෙන්ම යනවා. වසර 3නෙන් තුනට පරිගණක වැඩසටහන් අලුත් කිරීමට සිදුවෙනවා. මෙය ණය උගුලක් පමණක් නොව ජනතාවගේ කර මත පැටවෙන මර උගුලක්.

**බස්නාහිර පළාත් සභාවෙන් රු. මිලියන 8 ක් කපලා.**

හැම පළාත් සභාවකට බෙදා ඇත්තේ මෙලෙසයි. මෙගා පොලිස් කථාව මැද්දේ මුදල් කප්පාදුව තුලින් වන්නේ නාගරික පරිසරය වනසා කුණු කඳු ගොඩ ගැසීමයි. ඉදිරි වසරේ ජනතාවට ජීවත් වීමට වන්නේ කුණු ගොඩවල්, මදුරු වසංගත උණ, පාචනය ආදී බෝවෙන රෝග සමඟයි.

**ලංකාව ගෝලීය අගය දාමයට එකතු කරන හැටි පෙනේද?**

රුපියලේ වටිනාකම ඩොලර් 1 කට රු. 150/= දක්වා කඩා වැටීම සිදු වෙලා. එය ඉදිරියේ රු. 160/= දක්වා වැඩිවේවි. ඒනිසා ජනතාවගේ වියදම් වැඩිවෙමින් රටේ ණය බර වැඩි වෙමින් තිබෙනවා. රුපියල පහල වැටීම නිසා වැඩි වූ ණය ප්‍රමාණය රු.බිලියන 285කි.

2016 මුල් මාස 5 තුල පමණක් මසකට රු.මිලියන 1000 බැගින් ණයට එකතු වුනා. ඒ අගය රු. මිලියන 5000 ක් විදේශ ණයට එකතු වී තිබෙනවා. මේ තමයි ගෝලීය අගය දාමයට ලංකාවේ අපි එකතු වන හැටි.

ලෝක ඉන්ටර්ග්‍රිටි (Intergity) වාර්තාව අනුව ලංකාවෙන් වසරකට පිටවෙන කලු සල්ලි ප්‍රමාණය රු.බිලියන 2ක් ආදායම් බදු නොගෙවන කලු සල්ලි ධනවතුන් අල්ලා ගන්නට බැහැ. මහබැංකුවේ පියවුම් හා ගෙවීම් කාර්ය පුද්ගලික සමාගමකට දීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාවෙන් සිදුවන්නේ කලු සල්ලිකරුවන් දිරිමත් කිරීමකි.

**රජයේ සේවකයින්ගේ ජීවන තත්ත්වය කඩා වැටෙමින් තිබෙන්නේ**

රු. 10.000/= දීමනාව මුලික වැටුපට එකතු කිරීමට දැන් කාලය හරිය. බදුබර නිසා වැඩිවන ජීවන අංකයද, රුපියලේ වටිනාකම අඩුවීම නිසා ක්ෂය වන වැටුපද, එකට ගත් කල මෙය වහාම කල යුතුමය. විශ්‍රාමික වැටුපද වර්තමාන වැටුප්තලවලට ගැලපෙනසේ සකස් කල යුතුය.

සේවක අර්ථසාධක අරමුදලින් මෙතෙක් තිබූ නිවාස ණය පහසුකම නැවැත්වීම අපරාධයකි. සේවකයින්ගේ අරමුදල සේවකයින්ගේ යහපතට විය යුතුය. උපයනවිට ගෙවීමේ බද්ධ එකතු වී තිබේ. සියළු විශ්‍රාම වැටුප් වලින් අයකර ගන්නා බද්ධ 14% දක්වා වැඩි කර ඇත.

**රටේ භූමිය විකිනීම අභාග්‍යයක්**

අප රටේ භූමිය සහිත වරාය, 80% ක් චීන කොම්පැනියකටත්, කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය තවත් ඉන්දීය කොම්පැනියකටත් දෙන්න යනවා. ණය ගෙවීම සඳහා තමන්ගේ ගෑණිව පාවා දුන්නා වගේ වැඩක්. මෙය රට රැකුමට දිවිදුන් අපගේ මුතුන්මිත්තන්ගේ සොහොන් මත පැහැරීමකට සමානයි.

**සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් නොසලකා හරියි.**

විශාල ආයෝජකයන්ට ඔවුන් ආයෝජනය කල මුළු මුදල ගෙවිය යුතු බදුවලින් අඩු කරනවා. නමුත් අපේ කුඩා සුලු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය සඳහා 50% සහන පොලිය විතරයි. ඒ සඳහා වෙන් කර ඇත්තේ රු. මිලියන 500යි. නමුත් කඩා වැටෙන මූල්‍ය සමාගම් නඟාසිටුවීම සඳහා රු.මිලියන 1000යි. ඒකත් ලැබෙන්නේ සීමිත පිරිසකටයි. අනික් අයට බදුබර විතරයි. ඇයි සුළු ව්‍යවසායකයින් ආර්ථික වර්ධනයට දායක වෙන්නේ නැද්ද? ඔවුන් 60% ආර්ථික ක්‍රියාකාරිත්වයක් දරන බව දන්නේ නැද්ද?

**සේවක වරප්‍රසාද අයිතිවාසිකම් වල පල්ලේ**

පුද්ගලික අංශයේ හැම සේවකයෙකුම ආවරණය වන පරිදි වැටුපට අතිරේකව 2500/- ගෙවීමට ගෙන එනු ලැබූ නීතිය කොතරම් ක්‍රියාත්මකද? සේවකයින් කීදෙනෙකුට රු.2500/= ලැබිලාද? පුද්ගලික බස් සේවකයින්, මෑන් පවර් සේවකයන්ට EPF/ETF හා රු.2500/= දීමනාව ලැබෙනවාද? කම්කරු අමාත්‍යාංශය සියලු මෑන්පවර් කොම්පැනිකරුවන්, පුද්ගලික බස් හිමියන් ගෙන්වා එම සේවකයින්ට රු. 2500/- ඇතුලු ව්‍යවස්ථාපිත වරප්‍රසාද ලබාදීමට පියවර ගත යුතුය. නැත්නම් හාම්පුතුන්ට නඩු දැමිය යුතුයි.

**සමාජ වර්ධනයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදයක්**

සංවර්ධනය තුල විරැකියාව වැඩිවෙලා. 2015 වර්ධනය 4.8% සමග විරැකියාව 1% කින් වැඩිවීම රැකියා දශලක්ෂය සඳහා අපූරු ඇරඹුමක් නේද? අනිත් අතට 2014 වඩා වර්ධන වේගය 2015 පහළ දමා ගැනීම වර්ධනයේ නිරුවත පෙන්වනවා නොවේද? ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වර්ධනය සමාජ අර්ථයෙන් නිෂ්ඵලය. වර්ධනයක් නොමැති ප්‍රජාතන්ත්‍රවාදය දුප්පත්ය. සිංගප්පූරු ආදර්ශය ගැන කථා කරන අය මේ ගැන මතක තබා ගත යුතුය.

**සාගිනි දර්ශකයෙන් පහලට**

ජාත්‍යන්තර සාගිනි දර්ශකය මෑතකදී පලවී තිබුනා. රටවල් 118ක් අතර ලංකාව දර්ශක 65 සිට 80 දක්වා ස්ථාන 15 කින් පහල වැටී ඇත. උසට බර හා වයසට උස නැතිවීම හා ක්ෂයවීම මෙහිදී කැපී පෙනී ඇත. මේ තත්වය අප්‍රිකාවේ නැමීබියාවට සමානයි. මන්දපෝෂණ ඉලක්කම ජාතික සාමාන්‍යයක් ලෙස පෙන්වීමෙන් යථා තත්ත්වය වැසී යයි. මන්දපෝෂණයෙන් පෙලෙන නමයින් සංඛ්‍යාව අඩු ආදාම් ලබන 60%ක් පමණ ජනතාවගේ ප්‍රතිශතයක් ලෙස බැලුවහොත් ප්‍රතිශතය දෙගුණයකට වැඩිවිය හැකිය.

**ණය බර වැඩිවීම හා ජාතික සම්පත් විකිනීමේ විනාශය**

ණය බර මුල් මාස 18ක් තුල 23% කින් වැඩිකර ගැනීම පොඩි හපන් කමක්ද? දැනට ඇති මුළු ණය රු.බිලියන 7391 යි(ෆෝර්බස් දර්ශකය අනුව ඩො.බිලියන 64.9කි). වසර 1 1/2 තුල මෙය රු.බිලියන 8503 දක්වා වැඩිකර ගැනීම එසේ මෙසේ වර්ධනයක්ද? 2016 දී ණය ඩො.බිලියන 4.5ක්ද 2017 දී ඩො.බිලියන 4.0ක්ද ආපසු ගෙවිය යුතුයි. විදේශ මුදල් සංචිතය ඩොලර් බිලියන 8 සිට ඩොලර් බිලියන 7 බැහැලා. නමුත් ලංකාවෙන් ඩොලර් බිලියන 2 බැගින් මුදල් පිටවී යන බව ජාත්‍යන්තර දත්ත පෙන්නුම් කර තියනවා.

රාජ්‍ය ණය 2015 දී 15% හා 2016 දී 12% ඉහල ගියා. මේ ණය ගෙවීම සඳහා රාජ්‍ය දේපොල හා සම්පත් විකුණනවා. රජයේ කහටගහ ග්‍රැෆයිට් ලෝකයේ ඉහලම කාබන් ගුණයෙන් යුක්තයි. මේ වන විටත් එය ලාභ උපයන රාජ්‍ය ආයතනයක් ඒකත් විකුණගෙන කනවා. වැසී තිබුණු කහටගහ පතල නැවත අරම්භ කලේ 2005දී එහි සියලු ණය ගෙවා භාණ්ඩාගාරයටද මුදල් දී ඇත.

**සංචාරක කර්මාන්තය හා මැණික් කර්මාන්තය දියුණු කළ හැකිය.**

මැණික් හා රන් අබරණ උද්‍යාණයක් රත්නපුර අවට අක්කර 50 වැඩි භූමියක ආරම්භ කල හැකියි. මෙයට අවශ්‍ය ප්‍රාග්ධනයද පුද්ගලික ව්‍යාපාරිකයන් ගෙන්ම ලබාගත හැකියි. එහි මැණික් හා රන් ආභරණ වෙළඳාමද විවිධ දේශීය නිශ්පාදනද අලෙවි කල හැකිය. දේශීය සංස්කෘතික ප්‍රසංග කලාවන්ටද ඉඩක් ලැබේ. මැණික් කර්මාන්තයේ විවිධ අවස්ථා දැක්වෙන කෞතුකාගාරයක්ද, ගස් යට සුළු මැණික් වෙලඳුන්ට ඉඩකඩක්ද මෙහි සැපයිය හැකියි. මෙය ජාත්‍යන්තර වශයෙන් ප්‍රධාන මැණික් වෙළඳපොලක් කළ හැකියි.

**බැඳුම්කර මංකොල්ලයේ බර ජනතාවගේ කරපිට**

රනිල් අගමැති මූලික වී අර්ජුන මහේන්ද්‍රන් සහ ඇලෝසියස් සමග එකතු වී ලංකාවට හා ලක්වැසි ජනතාවට ක්ෂණිකව කල අලාභය රුපියල් මිලියන (දශලක්ෂ) 1600කි. පසුවට එය අනාගත පොලියට එකතු වන විට අලාභය තවත් වැඩිය.

රනිල් - අර්ජුන මේ වන විට සිටිය යුත්තේ රිමාඩ් භාරයේය. නැතහොත් අධිකරණයේය. නමුත් ආණ්ඩු බලය නිසා නීතිය හා උසාවිය ගොළු වී තිබේ. නීතිය ක්‍රියාත්මක කරන පොලිසියට පැමිණිල්ල බාර දීමටවත් අවස්ථාවක් නොදේ. නීතියේ ආධිපත්‍ය එහෙමයි. අන්තිමට එය නීතිය හසුරවන්නාගේ ආධිපත්‍යයි. එයිනුත් එහා එය අගමැතිගේ ආධිපත්‍යයි.

**ගෝලීය වර්ධන මායාව බිඳවැටීම**

රනිල් වික්‍රමසිංහ වැරදි කාලයක පත්වූ වැරදි නායකයෙක්. ට්‍රම්ප් හා Brexit සිදුවීම හා ඒ අනුව ගෝලීය ඒකාබද්ධ වර්ධනයක අපේක්ෂා බිඳවැටීම නිසා රනිල් වික්‍රමසිංහ මහතාගේ ගෝලීය අපේක්ෂා අනාථ වී ඇත. අද ඔහුට චීනය ඇතුළු BRICS කලාපයන්ට ගැලපීමට සිදුවීම කදිම සරදමකි. විදේශ ආයෝජන මතම පමණක් ආණ්ඩුවේ ඉරණම රැදී ඇති විටක පසු ගිය වසර 1 1/2 තුල විදේශ ආයෝජන ඩොලර් බිලියන 02 ක් ලංකාවෙන් පිටවී යාම ආණ්ඩුවට උස්මුරුත්තය හැදෙන වැඩකි.

**මහින්දගේ ආර්ථික පිලිවෙත වැළඳ ගැනීමට සිදුවීම**

මහින්ද රජය හැදු වරාය, ගුවන්තොටුපොල, වරාය නගරය නැත්නම් මොවුන්ට කිසිම මාවතක් නැහැ. ඒවා හදන විට උඩු බුරුලා ගෙන ඉඳලා අද ඒවායේම ලගින්න වෙලා. චීනයට අපවාද කියලා අද ඔවුන් ඉදිරියේ දන ගහගෙන වන් රෝඩ් - වන් බෙල්ට් (One road – one belt) පාඨය කියවමින් චීනය පසුපස ණය ඉල්ලා ගෙන යනවා.

**රනිල් - රවි දැන් පිට වී යාමට සූදානම් විය යුතුය.**

අප රටේ ස්වාභාවික පරිසරය ඇතුලු ජනතාව සතු ඉඩම්, රාජ්‍ය දේපොල, ආර්ථික මර්මස්ථාන සියල්ල විදේශීය හා අනුබද්ධ දේශීය කොම්පැනි වලට විකුණා අපේ දරුවන් ධනපතියන් යටතේ වහල් සේවයට යෙදවීම මොවුන්ගේ අයවැය සැලැස්මයි. ඒනිසා පොදු ජන විරෝධී විදේශ ගැති ධනපති මාවතේ ගමන් කරන රනිල් වික්‍රමසිංහ, රවි සමග දැන් පිට වී යා යුතු කාලය පැමිණ ඇත. පිට වී නොයතහොත් ජනයා ඔවුන් දෙපළ සහිත ආණ්ඩුව පිටමං කරනු ඇත.

වාමදේව විසිනි

## නීතියේ ආධිපත්‍යය සහ අධිකරනයේ බලය

ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර බලඅරගලයක් ඇති බව පැහැදිලියි. අගමැතිවරයා ත්‍රිවිධ හමුදාවන්ද තමන්ට අවනතකර ගත හැකි උපක්‍රමයක් ඔහු යටතේ ඇති අල්ලස් කොමිසම සහ පොලිසිය වැනි ආයතන හරහා ක්‍රියාත්මක කිරීමට යෙදුනු හෙයින් ජනාධිපතිවරයා තියුණු ලෙස ප්‍රතික්‍රියා කල බව පෙනේ. FCID, පොලිසිය හා අල්ලස් කොමිසම ස්වාධීන කොමිසන් යටතට පත්කළත් අගමැතිවරයා එම ආයතන දෙකම සහ නීතිපති කාර්යාලය තමන්ට ඉමහත්සේ ලැදි ප්‍රධාන විධායක නිලධාරීන් හරහා මෙහෙයවන බව නොරහසකි. මෙය ව්‍යවස්ථා සභා පත්කිරීම් සහ ස්වාධීන කොමිෂන් සංකල්පය ප්‍රායෝගිකව [නිශේධ] කර ඇත.

තවද කිසියම් පුද්ගලයෙකු දූෂණයක් හෝ මූල්‍ය අපරාධයක් ගැන සැකයට භාජනය වී සිටීනම් එම කරුණ ප්‍රසිද්ධියට පත් නොකොට අදාල පුද්ගලයා කැඳවාගෙන ප්‍රකාශ ලබා ගෙන, ඒ අනුව එම සැකකරු අත් අඩංගුවට ගෙන අධිකරනයට ඉදිරිපත් කල යුතු බව බලධාරීන් හට පෙනී යන කල්හි, ඔවුන් එම තොරතුරු අධිකරණයට වාර්තා කල යුතුය. ඉන් අනතුරුව අධිකරණය දෙන නියෝග මත එම ආයතනවල බලධරයන් ක්‍රියා කල යුතුය. තවද නීතිපතිතුමා වුවද යම් චෝදනාවකට යම් අයෙකු අධිකරණයට පැමිණ විය යුතුයයි තීරණය කළහොත් ඔහුද ඒ බව අධිකරණයට වාර්තා කර එතැනින් ලබා ගන්නා නියෝග අනුව ක්‍රියා කරනු හැර නීතිපතිට සෘජුව පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට හෝ අධිකරණයට පැමිණවීමට නියෝග කල නොහැකි විය යුතුය. අධිකරණය ඉදිරිපිටට සැකකරු කැඳවන අවස්ථාව වනතුරු එකී සිද්ධිදාමය ජනමාධ්‍ය මගින්ද නිරාවරණය නොකල යුතුය.

කෙසේ නමුත් FCID, පොලිසිය අධිකරණයේ ප්‍රශ්නයට ලක්වී ඇති හෙයින් , අධිකරණයේ තීරණයක් ලැබෙන තුරු FCID , පොලිසිය ක්‍රියා විරහිත කල යුතුය.


කෙසේ වෙතත් දූෂණ අල්ලස් හෝ මූල්‍ය අපරාධ චෝදනා එල්ල කිරීම සලකා බැලීම සඳහා ඇති අගමැතිතුමා මුල්වූ ජ.වි.පෙ. ආදීන් ඇතුලත් කොමිටිය වහාම විසුරුවා හැරිය යුතුය. නැතහොත් දේශපාලන පක්ෂග්‍රාහීකම් අනුව රාජ්‍ය යන්ත්‍රය ක්‍රියාත්මක වන්නේය. අනිත් අතට රාජ්‍ය විධායකයේ යම් ක්‍රියාවක් නිවැරදිව සිදු කළේදැයි විමසීමට මහජන නියෝජිතයින්හට ඇති අයිතිය සුරැකිය යුතුය.

## ශක්තිය පුවත්පතට ආධාර කරන්න

මූල්‍ය දුෂ්කරතා අභිබවමින් මාස්පතා ශක්තිය ඔබ වෙත එවීමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යෑම වෙනුවෙන් ඔබ ලබා දෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අප වෙත ලබා දෙන්න. ඔබගේ මුදල වෙනුවෙන් රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. සියලු මුදල් පහත දක්වන ආකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරුකරගත හැකි වන පරිදි එවන්න.

සරත් පද්මදාස
කලමණාකරු
ශක්තිය
49/1, විනයාලංකාර මාවත,
කොළඹ 10.
දුර/ෆැක්ස් : 011 2684820

# අමරසර නිසලවිය



ගීපද රාවය හදවත සිඹිමින්
ජාතියේ ජීවය රසයෙන් කළඹවා - නැලවූවා
සුන් අතර සිට ඔබහඩ දැන් වැයුම්
අමාරස පිරි අමර ගීතය සදාතනිකව
ඉතිහසයේ කල රැඳේවී
(වාසුදේව)

අමරදේව යනු හෙළයේ මහාගාන්ධවයා වේ. එසේ සඳහන් කරන්නේ එතුමාගේ සංගීත භූමිකාව හේතු කොටය. හේ භාරතයේ රාගධාරී සංගීතය මැනවින් ප්‍රගුණ කලද එය සිය භාවිතයට ගත්තේ අන්ධානුකරනයෙන් නොවේ. මෙරට ගීත රටාවන් මුසු කොට උත්තර භාරතීය මහා සම්ප්‍රදාය තුල දේශීය ජන සංගීතය චූල සම්ප්‍රදාය කොට කර නිර්මාන ප්‍රසස්ථය. වත්මන් රසිකයන් නිතරම අමර ගී සර සෙයො යමින් අමරදේව නිපයූ නාද රටා ඔවුන්ගේ මුවින් මුමුනන්නීය. ස්වර සංකලනයන්, නාදරටාත් එතුමාගේ පරිකල්පනයෙන් බිහිවූ සංගීතයත් සදා අනුස්මරණ වේ. අමරදේව ගී සරෙන් මතුවුනු ගීත කිහිපයක් මේ ලිපියෙහි තේමාව වේ. ඔහු සංගීතය පමණක් සොයා ගියේ නැත. ගීතමය බස්වහරය පිළිබඳව මැනවින් පත්‍යක්ෂ දැනුමක් ලැබුවේය.

අමරදේවනම් ගායකයා සංගීතඥයා නළුවා සිය ප්‍රතිභාව චිත්‍ර පටයකට මුසු කළේ සිංහල සිනමා වංශ කථාවේ දෙවන චිත්‍ර පටය වූ අශෝක මාලාවෙනි. ශාන්ති කුමාර්, ටී ආර්. ගෝපූ සම අධ්‍යක්ෂණය කළ එම චිත්‍ර පටයේ සංගීත අධ්‍යක්ෂණය කළේ මොහොමඩ් ගවුස් සිය වාද්‍ය වෘන්දයට ශිල්පීන් මෙරටින් තෝරා ගත්තේය.

එකී ගී පදවලට සංගීතය මුසු කිරීමේදී මොහොමඩ් ගවුස්ට සහය වූයේ ඇල්බට්ය. ඔහුගේ අසමාන දස්කම් නිසාම එම චිත්‍රපටයේ ඇතුලත් ගීතවලට ආමුඛ සංගීතයට මෙන්ම අතුරු සංගීතයට ගවුස් යොමු කළේය. භගිරාවතී ගයන "ප්‍රීති.... ප්‍රීති.....", "ශාන්ත මේ රාත්‍රිය", "ඇයි කළේ යමෙක් ආලේ'' ආදී ගීත ඇල්බට් සංගීත නිර්මාණය කල ගීත වේ.

ඇල්බට් පෙරේරා අමරදේව බවට පත්කළේ එදිරිවීර සරච්චන්ද්‍රයන්ය. ඒ භාරතයට සිය සංගීත අධ්‍යාපනය යොමු වීමට පෙරය. අමරදේව නාට්‍ය සංගීතයටද විශේෂ මෙහෙවරක් කල බව කිවයුතුය. ප්‍රේමකුමාර, එදිරිවීර සරච්චන්ද්‍ර, චිත්‍රසේන වැනි අගේ නිර්මාණයන් වන පබාවතී, කරදිය, ලෝම හිංස, නාට්‍ය රැසකට සංගීතයෙන් දායක වූයේය.

මුල් කාලයේ නිර්මාණය කළ ගී අතර "පීනමුකෝ කලු ගඟේ" ගීතය පබදා ගායනා කළේය. මෙය අමරදේවගේ සංගීත චාරිකාවේ මුල්ම පියවර කිහිපයක ඔහු හඳුන්වා ඇත. මෙය පොහෝ දිනක ඇතිවුනු චමත්කාරය ගැන කියවෙන්නැකි.

අමරදේව ගුවන්විදුලියේ සංගීත අංශය භාරව නායකත්වය ගැනීමෙන් අනතුරුව ගුවන් විදුලියේ තිබූ අනුකාරක ගීත වෙනුවට දේශජ ගීත සම්ප්‍රදායක් බිහිකිරීමට කැප වූ බව කිව යුතුය.

අමරදේවයන් කිසිදු ගුරු කුලයකට යට වූයේ නැත. අමරදේවගේ ජන ගායනා වැනි වැඩ සටහන්වලදී ඉදිරිපත් කල ගායනා බොහෝ විට ගත් වහරට මෙන් ගැමි වහරට යොමු වූ බව කිව යුතුය. චිත්‍රපට වලදී තේමාවට අනුගත වී පුරවහරට මෙන්ම ගැමිවහරට මුසු වූ ගීතයන් දක්නට ලැබේ.

ලංකා සමසමාජ පක්ෂයේ තරුණ සමිති ගීතය ලිව්වේ මහගම සේකරය. මේ ගීතය, ලියැවුණු හැටි වෙනම ලිපියකින් ලිවිය හැකිය. එසේ ලියූ ඒ ගීතය නම්,

**වැසි වසිනා අහස අපි මුතු බදිනා මුහුද අපි**
**මුතු තිබෙනා පොළොව අපි ශ්‍රී ලංකා රටම අපි ....**
**ගොඩනැගෙනා හැටි ගොවියෝ අපි**
**කම්කරුවෝ රට රකිනා ජනතාවෝ**

මෙම ගීතය මුලින්ම ගුවන් විදුලිය එක් කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ අමරදේව සූරීන්ටය. මේ ගීතය ගුවනට මුසු කිරීමේදී එවකට ගුවන්විදුලියේ පාලකයන්ට අසිරු තීන්දුවක් ගැනීමට සිදු විය. එනම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයන්ගේ මතිමතාන්තර අනුව එම ගීතයේ පද කිහිපයක් වෙනස් කිරීමට සිදුවිය. "ගොවියෝ අපි කම්කරුවෝ" වෙනුවට "වැසියෝ අපි රට වැසියෝ" යන වදන් කිහිපයක් එම වෑල්ඩිං කිරීමට සිදුවිය.

**"නිවහල් සිතුවිලි සිතනා සිතත් උදාරයි - නිවහල් නිමැයුම් මවනා අතත් උදාරයි"**

අත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැතිවරණ ලකුණ හෙයින් එම පක්ෂයට ප්‍රතිචාරයක් ලැබෙන හෙයින් එවකට පැවැති එක්සත් ජාතික පක්ෂය 'අත' යන වචනය ඉවත් කිරීමට කටයුතු කළේය. මේ ගීත දෙකම මහගම සේකරගේ පදවැල්ය.

ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා දිවංගත වූ මොහොතේ අමරදේව "සොයුරානන් ඔබේ නාමෙන් හෙටත් සූරියමල් පිපේවා" ගීතය ගුවනට මුසු කළේය. අතිගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහිමි කිරීමට එරෙහිව ලියූ පෙත්සමට අත්සන් කිරීම නිසා අමරදේවගේ ගීත ගුවනේ දී වාරණය වූයේය.

එහෙත් දේශපාලන වාරනයන් අභිබවා අමරදේවයන්ගේ ජනප්‍රියතාවය දිනෙන් දින හිනිපෙත්තටම එසවිනි.

**ඩබ්.කේ.ඩබ්. ප්‍රනාන්දු විසිනි**

# ලංකාවේ සිදු වූ විශාලතම සාපරාධී මහජන මුදල් වංචාවට හවුල්කරුවෙක් වූ අගමැතිට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනු

2015 මාර්තු මාසයේ සිදු වූ සාපරාධී මහා බැඳුම්කර වංචාව පිලිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රශ්ණ මතු කරනු ලැබීය. මෙයට සෘජුවම වගකිව යුතු බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් ගැන සහේතුක සැකයක් ඇති බව හෙලි විය. ඉන් පසු එය විභාග කිරීම භාර වූ පාර්ලිමේන්තුවේ ව්‍යාපාර ගිණුම් කමිටුවේ වාර්තාව ලබා දීමට දවසක් තිබියදී ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව විසුරුවා හැරියේය. එම නිසා එම වාර්තාව වලංගු නැති විය. ඔහු එසේ කලේ ''රනිල් වික්‍රමසිංහ බේරා ගැනීමට'' බවද පසුව ඔහු පළ කලේය. අගමැති තුමාට මේ අපරාධයට ඇති සම්බන්ධය ඉදිරිපත් කළ නොහැකි වූ එකී වාර්තාවේ මනාව දක්වා ඇත.

එම වාර්තාව සැකසීමට පෙර ''හොරාට පෙර කෙහෙල්කැන වැට පනිනවා'' මෙන් එකී සාපරාධී වංචාව ගැන සොයා බැලීමට අගමැති විසින්ම තෝරාගත් නීතිඥවරුන් තිදෙනෙකුගේ කමිටුවක් පත් කලේය. එම කමිටු වාර්තාව අනුමත කරමින් අගමැති තුමා එම වාර්තාව උජාරුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් අර්ජුන මහේන්ද්‍රන් නිදොස් බව ප්‍රකාශයට පත් කලේය. අගමැති එමගින් පාර්ලිමේන්තුව නොමඟ යැව්වේය.

ඉකුත් මහා මැතිවරණයෙන් පසු පත් වූ ව්‍යාපාර ගිණුම් කාරක සභාව (කෝප්) නැවත මෙම විභාගය ඇරඹීය. වසරකට වැඩි කාලයක් පැවති එම විභාගයෙන් පසු අර්ජුන මහේන්ද්‍රන් මහ බැංකු අධිපති සහ ඔහුගේ බෑනා වන ඇලෝසියස් මේ මහා වංචාවට කෙලින්ම වගකිව යුතු බව නිගමනය කර ඇත. පළවැනි හා දෙවන බැඳුම්කර නිසා රජයට සිදු වූ අලාභය රුපියල් මිලියන1600ක් බව විගණකාධිපති එම කමිටුවට වාර්තා කලේය.

එනිසා මෙම වංචාව යටපත් කිරීමට අගමැති ඇටවූ ත්‍රිපුද්ගල කොමිටි වාර්තාව බොරුවී ඇති අතර, අගමැති දැන් විත්ති කූඩුවට නැංවී ඇත. මීට අමතරව මහේන්ද්‍රන් නැමති මේ අපරාධකාරයා නිදොස් කිරීමටද, ඔහුට විරුද්ධව තිබූ පරීක්ෂණ අවුල් කිරීමටද මේ පිලිබඳව පොලිස්පතිට, නිතිපතිට සහ අල්ලස් කොමිසමට යවන ලද මන්ත්‍රීවරුන්ගේ පෙත්සම් විභාග කිරීම වැලැක්වීමටද අගමැති ක්‍රියාකර ඇත. රවි, මලික්, කබීර් ආදීහු අදාල දිනයන්හි මහ බැංකුවේ හොල්මන් කලේ නිකම්ම නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩලයද නොදැන ලංකා බැංකුවේ මුදල් මේ ගනුදෙනුවට යටකර ඇත්තේ කෙසේද? මේ සියලු කරුණු හෙලිවී තිබියදී අර්ජුන මහේන්ද්‍රන් නැවත එම ධූරයටම පත් කර ගැනීම සඳහා ජනාධිපතිතුමාට අගමැති විසින් බල කිරීමද ඇතුලු පර්යේෂණ සාක්ෂි රැසක්ම අගමැතිට විරුද්ධව දත් විලිස්සාගෙන නැගී සිටී.

මේ සාපරාධී වංචාව ගැන මින් එහා කළ යුතු එකම කාර්යය අර්ජුන මහේන්ද්‍රන් ඇතුළු විත්තිකරුවන්ට විරුද්ධව නිසි අධිකරණයේ චෝදනා ගොනු කිරීමය. එමෙන්ම අගමැතිවරයාට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කිරීමය. අගමැතිවරයා එම ධූරයේ සිටින තුරු නීතියේ ආධිපත්‍ය හිතුවක්කාර ලෙස යටපත් කරමින් ඇත. අපරාධකාරයෙකු තවත් ප්‍රධාන නිලතලයකට ද පත් කර තිබේ. එනිසා අගමැති වහාම අස් කිරීමට උවමනා ප්‍රබල ජනමතය දැන් වහ වහා ඒකරාශී කළ යුතුය.


එමෙන්ම අගමැතිට විරුද්ධවද නීතිය ක්‍රියාවට නැංවීම උදෙසා ජනාධිපතිතුමා ඇතුළු රජයේ නීති අංශවලට බල කල යුතුය. මේ ගැන අධිකරණයටද අප යා යුතුය. මෙම අපරාධයට වඩා සුළු සිද්ධීන් මුල් කර ගෙන අල්ප වශයෙන් ඇති කරුණු මුල්කර ගෙන දේශපාලන විරුද්ධවාදීන් මූල්‍ය අපරාධ පොලිස් කොට්ඨාශය (FCID) හරහා කීදෙනෙකු රිමාන්ඩ් භාරයට හා අධිකරණයට ගෙන යනු ලැබුවේද මේ අගමැතතිවරයා නොවේද?

පොදු දේපොල පනත යටතේ සහ දන්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පැවරිය යුතු හොර දෙටුවෙකු රකින අගමැති ඇතුළු රජයට මේ ගැන හැංගිමුත්තන් කෙලීමට ඉඩ නොහල යුතුය. ජනාධිපති තුමා විසින් අර්ජුන මහේන්ද්‍රන් පත් කළ අතර, ඔහුද වගකීමෙන් බැඳී සිටින බැවින් නීතිය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා නගරයෙන් නගරයට ජනමතයේ ගින්න අවුලුවාලීමට අපි එකතු වෙමු.

**කොළඹ ජනතා පවුර**

**කොළඹ නගර සභා හිටපු නාගරික මන්ත්‍රී**
**මහින්ද කහඳගම**

# බැඳුම්කර මගඩියට හවුල් වූ අගමැති වහා අස්විය යුතුයි. නැත්නම් අස්කල යුතුයි.



විදේශිකයෙකු වූ අර්ජුන මහේන්ද්‍රන් යම් ඇමතිවරුන්ගේ ද විරෝධය නොතකා මහ බැංකු අධිපතිකමට පත් කලා. ඔහු ගැන වගකීම බාරගන්නා බවට ප්‍රකාශ කලා. හොරකම වැහීමට හෙන්චයියන් තිදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කොමිටියක් දමා අර්ජුන මහේන්ද්‍රන් නිර්දෝෂී කලා. එය උජාරුවෙන් පාර්ලිමේන්තුවට වාර්තා කලා. කෝප් කමිටුවේ තීන්දුව වලක්වන්නට යූ.ඇන්.පී. කමිටු මන්ත්‍රීවරුන් ලවා සිදු කල බලපෑම පසුපස රනිල් වික්‍රමසිංහ සිටියා. එනිසා මෙම වංචාවේ දූෂිතයින් නීතිය ඉදිරියට පැමිණවීමේදී රනිල් මහතාත් වගඋත්තරකරුවෙක්. ඒ නිසා ඔහු වහාම අගමැති තනතුරින් ඉල්ලා අස්විය යුතුයි. 'බැඳුම්කර මගඩියේ අගමැති භූමිකාව' මැයෙන් පසුගිය 21 වෙනිදා කොළඹ මහජන පුස්තකාලයේදී පැවති සම්මන්ත්‍රණයේදී වාසුදේව නානායක්කාර සහෝදරයා එසේ පැවසීය.

එහිදී තවදුරටත් අදහස් දැක්වූ වාසුදේව සහෝදරයා මෙසේද පැවසීය. බැඳුම්කර හොරකම ගැන කෝප් කමිටු වාර්තාව නීතිපතිට භාරදී නිතිපති දැනුවත් කළ බවත් ඒ සම්බන්ධයෙන් නිතිපති සමඟ ඉදිරියට කටයුතු කිරීමට කථානායකතුමාට දැනුම් දුන් බවත් අගමැති පවසනවා. නිතිපති කථානායක දෙදෙනාම සිටින්නේ අගමැති යටතේ. අද නීතියේ ආධිපත්‍ය හසුරුවන්නේ අගමැති විසිනුයි.

දැන් රටේ ක්‍රියාත්මක වන්නේ අගමැතිගේ ආධිපත්‍යයයි. රනිල් අගමැති තනතුරේ සිටින තුරු සාධාරණ පරීක්ෂණයක් පැවැත්වෙන්නේ නැත.

බැඳුම්කරය මුවාවෙන් මේ වනවිට මහ බැංකුවෙන් රුපියල් දශලක්ෂ 1600ක් අර්ජුන මහේන්ද්‍රන් හා ඔහුගේ බෑනා එකතුවී යටම්ඩි ගසා ඇති බව පාර්ලිමේන්තු කමිටු තීන්දුවේ සඳහන් වෙනවා. පරීක්ෂණය මෙහෙයවීමට ශ්‍රේෂ්ඨාධිකරණයට භාරදීමට ජනාධිපතිට බලය ඇති බවත් ජනාධිපති මේ සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්දැයි වාසුදේව සහෝදරයා ප්‍රශ්ණ කලේය.

මෙම රැස්වීමේදී ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ මැතිතුමා, බන්දුල ගුණවර්ධන මැතිතුමා, ආචාර්ය දයාන් ජයතිලක මැතිතුමා, උදය ගම්මන්පිල මැතිතුමා යන අය අදහස් දැක්වූ අතර,පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගාමිණී ලොකුගේ මැතිතුමා, ජයන්ත සමරවීර මැතිතුමා, රංජිත් සොයිසා මැතිතුමා, මහාචාර්ය තිස්ස විතාරන මැතිතුමා යන අය ඇතුලු විශාල පිරිසක් සහභාගි වූහ.

සටහන - එස් වත්තගේ

## නව පරපුරට ආදර්ශමත් වූ වාමාංශික නායකයා තිස්ස වීරසිංහ සහෝදරයා

කිරිඇල්ල හාන්දුකන්ද විසූ තිස්ස වීරසිංහ සහෝදරයා මෑතකදී අප අතරින් වියෝ විය. වාමාංශික ව්‍යාපාරයේ දර්ශනය අනුව තම ජීවිතය හැඩගස්සා ගෙන සිටි සීමිත පිරිස අතර ඔහුද නව පරපුරට ආදර්ශයක් ලබාදිය හැකි ග්‍රාමීය නායකයෙක් විය.

දුප්පතුන් හා ඉඩම් හිමි ධනවතුන් අතර පැවතුන සමාජ පරතරය හොඳින් අත්දුටු තිස්ස සහෝදරයා සාධාරණය මුල් වූ සමාජ වෙනසක් පිලිබඳ අදහස ඔහුගේ සිත තුල ලියලන්නට වූයේ කුඩා අවදියේ සිටය. දෙමාපියන්ගේ ධාර්මික ජීවන පැවැත්ම අනුව තිස්සගේ ලමා අවධිය ගමේ පන්සලට භාර විය. තරුණ වියට පත්වෙන විට ලෞකිකව අත් දකින සමාජ අසාධාරණය වෙනස් කළ යුතු බව මනසට වධ දෙන්නට විය. එහි ප්‍රතිඵලය වූයේ තිස්ස සහෝදරයා ගිහි ජීවිතයේ දුක් ගැහැට විඳිමින් සමාජ වෙනසක දර්ශනය වෙනුවෙන් ප්‍රායෝගික මිනිසෙකු වීමය.

වාසුදේව සහෝදරයාගේ 1970 සමගි පෙරමුණු සටන් වේදිකාවට ගොඩ වූ තරුණ තිස්ස සහෝදරයා ගැඹුරු හඬින් වේගවත්ව ඉදිරිපත් කළ අදහස් දැක්වීම ගැමි තරුණ තරුණියන්ගේ පමණක් නොව බුද්ධිමත් පිරිසකගේද අවධානය ඇද බැඳ ගැනීමට සමත් විය.
මාක්ස්වාදී දර්ශණය පිලිබඳ විහිදී ගිය ගැඹුරු දැනුමක් ඇති තිස්ස වීරසිංහ සහෝදරයාගේ භාෂා ඥානය හා සාහිත්‍ය දැනුම උපයෝගී කරගෙන ජනතාවගේ හදවත් අවුලවන කථිකයෙක් පමණක් නොව සභාව කුලුගන්වන කවීත්වයක්ද ඔහුගේ සහජ උරුමයක් විය. එනිසා එතැන් පටන් වාමාංශික දහරාවේ හැම වේදිකාවකම තිස්ස සහෝදරයාගේ හඬ අවදි විය. ඔහුව අගය කිරීමද අධ්‍යාපන හා ප්‍රායෝගික දැනුමද නිසා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ රැකියාවකට ඇතුලු වීමට ඔහුට හැකි විය.

විවාහ දිවියට ඇතුලත් වූ තිස්ස සහෝදරයා තම ජිවිතයේ නිදහස ලැබුණු වැඩිම කාලයක් සමාජ යහපත වෙනුවෙන් යෙදවීමට උනන්දු විය. ඉතා දුෂ්කර කඳුකර ප්‍රදේශයක් වූ කිරිඇල්ල හාන්දුකන්ද සහ අවට ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම වෙනුවෙන් දිවා රෑ නොබලා වෙහෙස විය. මාර්ග පද්ධතිය, විදුලිය, බස්රථය, පාසල, පන්සල පමණක් නොව රජයෙන් ලැබිය යුතු සැම සහනයක්ම ජනතාවට ලඟා කර දෙන ප්‍රබල නියෝජිතයෙක් විය. ඔහු එවිට සමාජ සේවකයෙක් පමණක්ම නොව උද්ඝෝෂකයෙක් ලෙසද පෙනී සිටියේය. කුමන සභාවක වුවද තමන්ට ඇති අවංක මතය නිර්භයව පලකිරීමට තිස්ස සහෝදරයා සමත් විය.
තිස්ස වීරසිංහ සහෝදරයා කිසිවිටකත් පාරිභෝජනවාදය අගය නොකල අයෙකි. සරල අපිස් ජිවිතයේ වටිනාකම අත් දකිමින් එයින් සතුටට පත්විය. ජය මෙන්ම පරාජයද ආර්ථික දුෂ්කරතාවයන් නිසා ඇතිවන පසුබෑම්වලදී නොසැලී මුහුණ දෙමින් තම ජීවිතයේ අර්ථයත් තම සගයන්ගේ චිත්ත ධෛර්යත් රඳවා තබා ගත්තේය. ඔහුගේ උතුම් ලක්ෂණය වූයේ තම වාසිය සඳහා දේශපාලනය පාවිච්චි නොකිරීම මෙන්ම පිල්මාරු නොකිරීමය. තම සගයන්ගේ අදහස් සමග නොගැලපෙන අවස්ථාවන්හිදී ඈත්වී නිහඬව සිටියත් නැවතත් ජනතාවගේ උද්දීපයනයත් සමඟ ඡන්දය හා සටන් උනුසුම මතුවන විට දුන්නෙන් මුදාහල හීයක් මෙන් වේගවත්ව නැගී සිටියේය. එබැවින් කෙටිකලක් රෝගාතුරව සිටි තිස්ස සහෝදරයා රතු ධජයේ ශක්තිය දෝතින් ඔසවාගත් වාමාංශික මතධාරී නායකයෙක් ලෙස අවසන් හුස්ම හෙලුවේ නව පරපුරේ සටන්කාමී වාමාංශිකයින්ට ආදර්ශයක් සපයමිනි.

## එපා පිච්චමල් පාගන්න

එපා පරව ගියත් - පිච්ච මල් නම් පාගන්න
මලක් නම් එල ලබා - පරපුරක් බිහි කිරීමයි
පොදු ලෝ දහම - ඒත් පිච්ච මල්?
සමනල හෑඟ ඈ - සිප ගැනීම් ලැබුවද
පිවිතුරු බව රැක ගත් - පිච්චමල් එපා පාගන්න
පුදසුන මතට - සසර ගමන කෙලවර කරන
පිච්ච මල් එපා පාගන්න !

හිඟුල මංගල විජේසිංහ

## අපගේ ශෝකය.

සම සමාජයෙන් පන්නරය ලැබූ ඇහැලියගොඩ එරික් සහෝදරයා ශක්තිය පුවත්පතේ කළමනාකාර ධුරයක් හොබවයි. ඔහු ඇතුලු පවුලේ සියලු දෙනාම1970 වාසුදේව සහෝදරයා සමඟ අත්වැල් බැඳගනිමින් වාමාංශික ව්‍යාපාරය සමඟ කැපවී කටයුතු කළ අතර ඔහුගේ ආදරනීය මෑනියන් වන පී.පී. පොඩිනෝනා මාතාව සියක් වසක් ආයු වලඳා පසුගිය දිනක අප අතරින් වෙන්විය. ඒ පිලිබඳව අප සැමගේ ශෝකය පළ කරමු.

---

ප්‍ර.වාමාංශික පෙරමුණේ පස්සර හිඟුරුකඩුව ඉඹුක්තැන්නේ එච්.බී. දිසානායක සහෝදරයාගේ දයාබර මෑනියන් පසුගිය දිනක සදහටම අපෙන් වෙන්විය. ඒ පිලිබඳව අපගේ ශෝකය පළ කරමු.

---

රත්නපුරයේ සමසමාජ ව්‍යාපාරයේ පුරෝගාමීව කටයුතු කල පොඩි අප්පුහාමි සහෝදරයාගේ බිරිඳ වන රන්මැණිකේ වැරනියගොඩ මාතාව වසර අනු දෙකක් ආයු වලඳා පසුගිය දිනක අප අතරින් වෙන්විය. එම දෙපොලගේ පුත් ලක්ෂ්මන් සහෝදරයා ප්‍ර.වාමාංශික පෙරමුණේ ක්‍රියාකාරී ප්‍රාදේශීය නායකයෙක් වන අතර එම පවුලේ සියලු දෙනාම 1970 සිට වාසුදේව සහෝදරයා සමඟ පෙරමුණේ ගමන් ගත් සමාජවාදී ව්‍යාපාරයේ සටන් සඟයන් විය. රන්මැනිගේ මාතාවගේ අභාවය පිලිබඳ අපගේ ශෝකය පලකරමු.

ශක්තිය

# "කුමාර් ගුණරත්නම්ගේ ප්‍රශ්ණය"

## ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටළුවක් -සේනාධීර සහෝදරයා-




කුමාර් ගුණරත්නම් සහෝදරයාගේ පුරවැසිභාවය වෙනුවෙන් ඔහුගේ සරසවි මිතුරන් විසින් කොළඹ පදනම් ආයතනයේදී සංවිධානය කළ සම්මන්ත්‍රණයක් දේශපාලන පක්ෂ නායකයෝ, සිවිල් ක්‍රියාකාරීන් සහ කලාකරුවෝ රැසකගේ සහභාගීත්වයෙන් කුමාර් ගුණරත්නම්ගේ ප්‍රශ්ණය සහ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය යන තේමාව ඔස්සේ නොවැම්බර් 07 වනදා පැවත් වුනි.

එහිදී අදහස් දැක්වූ පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ලේකම් සේනාධීර ගුණතිලක සහෝදරයා මෙසේ පැවසීය. අප සියලු දෙනාම දන්නවා කුමාර් ගුණරත්නම් සහෝදරයාගේ පුරවැසිභාවය පිළිබඳ ගැටලුව යුක්තිය පිළිබඳ ගැටලුවක් බව. ලංකාවේ 70 දශකයෙන් පසු යම් ගැටුම් සහගත තත්වයන් ප්‍රචන්ඩ ස්වරූපයක් ඇතිවන විට පාලකයන් විසින් ඒ තුළ රාජ්‍ය ත්‍රස්තවාදයක් ක්‍රියාවට යෙදවූ බව අපි දකිනවා. 80 දශකයේත් ඉන්පසු 90 දශකයේ සහ මේ දක්වාම කුමාර් සහෝදරයාව වරින්වර විවිධ අවස්ථාවල මර්ධනයේ ඉලක්කයක් බවට පත් වුනා. ඒ නිසා මේක එක් අවස්ථාවක ප්‍රශ්ණයක් නොවෙයි. ඒ වගේම මේ අද ඊයේ කතාවකුත් නෙවෙයි. එසේම එක ආණ්ඩුවක හෝ දෙකක කතාවකුත් නෙවෙයි. මේ ප්‍රශ්ණය පහුකරගෙන ඇවිත් මේ සාකච්ඡාවට එළඹෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සාකච්ඡාව අද මේසය මත තිබෙන වෙලාවකයි. කුමාර් ගුණරත්නම් සහෝදරයාට වසරක සිරදඬුවමින් පස්සේ ඔහු පිටුවහල් කර පළවා හරින බවට ප්‍රකාශ වෙනවා. දැන් තියෙන්නේ සිර දඬුවම අවසන් වුනාම පිටුවහල් කිරීමයි. කුමාර් ගුණරත්නම් සහෝදරයාට යම් දවසක පුරවැසි අයිතිය දෙන්න වෙනවා. හැබැයි ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්ණය එතැනින් ඉවර වෙන්නේ නෑ. යුධ බේදවාචකයෙන් පස්සේ මහා මිනිස් සංහාරයක් ඉවරවෙලත් ඔබ විස්වාස කරනවද චෝදනා මොනවත් නැතිව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ අවුරුදු 15 රඳවාගෙන ඉන්න කෙනෙක් ගැනරෑ එක වේලාවකදී ලේබල් එකක් තියෙනවා උතුරේ ත්‍රස්තවාදීන් කියලා. තවත් වෙලාවක දකුණෙහි කැරලිකරුවන්, ඊලගට පාතාලය, ඉන්පස්සේ මැරයන් කියනවා. මේ කියන්නේ අපට කරදරකාරී මිනිසුන් නිසා ඒ අයගේ ප්‍රශ්ණ අපට අදාල නෑ කියන එක. ලංකාවේ මානව නිදහස පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ගැන කතා කරනවානම් අපට ඒ කතිකාව ගොඩනගන්න වෙන්නේ අප අතර, ඔබ අතර, වාමාංශිකයන් අතර, ප්‍රගතිශීලීන් අතර, සමාජ කතිකාවක් හැටියටයි. කුමාර් කෙනෙකු නොවෙයි එදාට වෙන කෙනෙකු හමුවේවි. ඒ නිසා මේ ප්‍රශ්ණය අපේ ප්‍රශ්ණයක් හැටියට ගන්න, ලෙස ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා.

සටහන - හරිස්චන්ද්‍ර පිරිස් -

## වර්ජනයේ යෙදී සිටින කම්කරු නිලධාරීන්ගේ ප්‍රශ්ණ වහා විසඳිය යුතුයි.

කම්කරු සබඳතා සේවා ව්‍යවස්ථාව ස්ථාපිත කිරීම, මඩිහේ හේවා කමිටු වාර්තාව අකුලා ගැනීම, කම්කරු නිලධාරීන්ගේ නිවාඩු කප්පාදුව අහෝසි කිරීම යන කරුණු මුල් කර ගනිමින් ආරම්භ කර ඇති කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය වහාම සමතයකට පත් කර ගැනීමට කම්කරු අමාත්‍යවරයා මැදිහත් විය යුතුව ඇත. ඔහුට එම කටයුත්ත කිරීමට නොහැකි නම් වර්ජිත සේවකයින් සමඟ සමථයක් ඇති කර ගැනීම සදහා රජය වහා කටයුතු කළ යුතුව පවතී.

කම්කරු නිලධාරීන්ගේ වර්ජනය නිසා අධිකරණය ඉදිරියේ ඇති කම්කරුවන්ට බලපාන නඩු විශාල සංඛ්‍යාවක් ගොඩ ගැසෙමින් පවතින අතර කම්කරු ආරවුල් රාශියක් සමතයකට පත් කර ගැනීමට නොහැකිව ඇති බවද වාර්තාවේ. මෙම වර්ජනය විසඳුමක් නොමැතිව දිග් ගැසීමට කටයුතු කිරීමෙන් සිදු වන්නේ විවිධ සේවාවන්හි නිරතව සිටින පුද්ගලික අංශයේ කම්කරුවන් හා සේවකයින් පාලකයින් ඉදිරියේ මහත් පීඩාකාරී තත්ත්වයට පත්වීමය. කම්කරුවන් හා සේවකයින් වෙත නීතියෙන් මෙතෙක් කලක් ලබා දී තිබූ ආවරණයන් නිරාවරනය කර කොම්පැනි අයිතිකරුවන්ට සිත්සේ කටයුතු කිරීමට ඉඩ සැලසීමත් මේ තුලින් සිදුවන බව අවධාරණය කරමු.

කම්කරු සබඳතා සේවා ව්‍යවස්ථාවන් ස්ථාපිත විය යුත්තේ කම්කරු නිලධාරීන්ගේ ද එකඟතාවයන් ඇතිවය. එසේ නොමැතිව සේවක අයිතිවාසිකම් විනාශවී යන ආකාරයෙන් කටයුතු කිරීම ආරම්භ වුවහොත් රාජ්‍ය අංශයේ අනෙකුත් සේවා අංශයන් තුලටද මෙම ආරවුල පැතිරී යා හැකි බව මෙයින් අවධාරනය කර සිටිමු.

**වැඩබිම ජන බලය**

# රටපුරා ජන අරගල ඇවිලේ.

## දොස්තර සංකේත වර්ජනයක්

## සමෘද්ධි නිලධාරීන් පාර්ලිමේන්තුව වට කරයි.

## බස්, ත්‍රීවීලර් දෙසැ. 01 වර්ජනයකට සැරසේ.

## දුම්රිය ඒකාබද්ධ පෙරමුණ විශ්‍රාම අයිතිය, දුම්රිය ඉඩම් රැක ගැනීමට දිනක වර්ජනයක්.

## විශ්ව විද්‍යාල සිසුන් නිදහස් අධ්‍යාපනය රැක ගැනීමේ පාගමන් අරඹයි.

### ජා ඇල කුණු බෑමට එරෙහිව ජනතාව නැගිටියි.

මීතොටමුල්ල ප්‍රදේශයේ ගොඩ ගසා තිබෙන දුගඳ හමන කුණු කන්ද ජා ඇළ ඒකල ප්‍රදේශයට ගෙන ඒමේ ආණ්ඩුවේ තීරණයට එරෙහිව ජා ඇල, ඒකල හා සීදුව ප්‍රදේශවාසීන් පසුගියදා (16) ජා ඇල, නගර මධ්‍යයේ දැවැන්ත උද්ඝෝෂණයක නියලුණි. "කොළඹ කුණු අපිට එපා" "ජෝන්ට ලකුණු අපිට කුණු" යන්නෙන් සඳහන් සටන් පාඨ පුවරු රැගත් උද්ඝෝෂකයෝ මාර්ග හරස් කරමින් ටයර් පුලුස්සා දමමින් සිය වාරෝධය පළ කළහ. දහස් ගණනකගේ සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම විරෝධතාවයේ ප්‍රකෝප වූ පිරිස් විසුරුවා හැරීමට පොලිසියටද මැදිහත්වීමට සිදුවිය.

### අපිට බොන්න වතුර දියව්

බණ්ඩාරවෙළ ජනතා විරෝධය

යහපාලන ආණ්ඩුව ජන මතයට කන්නොදී කරගෙන යන උමා ඔය ව්‍යාපෘතියට එරෙහිව බණ්ඩාරවෙල හා ඒ අවට ජනතාව දහස් ගණන් එක් රොක්ව පෙළපාලි යමින්, සටන් පාඨ කියමින් බණ්ඩාරවෙල නගර මධ්‍යයේ විරෝධතාවයේ නියැලුණි. ව්‍යාපෘතිය නිසා සිදුවෙන පරිසර හානිය හා ජල උල්පත් වැසී යාම නිසා උද්ගත වෙන පානීය ජල ප්‍රශ්ණ මෙම විරෝධතාවයට හේතු විය. බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය හා අවට මාර්ග අවහිර කරමින් පැවැත් වූ මෙම ජනතා විරෝධය පොලිසිය රැගෙන ආ මහේස්ත්‍රාත් නියෝගයක් මත අවසන් කිරීමට සිදුවිය.

### වෙරළ තීරයේ වැලි ගොඩ දැමීම නවතනු

මීගමුවෙන් ධීවර හඬක්

කොළඹ වරාය නගරය ඉදිකිරීම සඳහා මීගමුව වෙරළ තීරයෙන් මහා පරිමාණ වැලි ගොඩ දැමීම නිසා මුහුදු තීරයේ සිදුවෙන මහා විනාශයට විරෝධය පලකරමින් උස්වැටකෙයියාව සිට පෝරුතොට දක්වා ජීවත්වෙන ධීවරයෝ මීගමුව මහ නගර සභා භූමියේදී උද්ඝෝෂණයක් නියැලුණි. පසුව ගල්කන්ද දුම්රිය මාර්ගයද හරස් කරමින් සටන් පාඨ කියමින් පෙළපාලි යෑම නිසා හලාවත කොළඹ දුම්රිය ගමනා ගමනයද ඇණ හිටියහ. ආණ්ඩුවට දැවැන්ත අභියෝගයක් එල්ල කරමින් මෙම ධීවරයෝ ප්‍රකාශ කරණුයේ වැලි ගොඩ දැමීම නිසා මුහුදු මත්සයින් වඳවී යෑමේ තර්ජනයකටද මුහුණ දීමට සිදුවන බවයි.

### කොලොන්නාව ලෑස්තියි.



ගංවතුරෙන් පීඩා විඳින කොළොන්නාව ප්‍රදේශයේ ජනතාව, ආණ්ඩුවේ ප්‍රබලයින්ගේ අණුදැනුම මත සිදුකෙරනෙ මහා පරිමාණයේ පහත් බිම් හා වෙල් යායන් ගොඩ කිරීමට එරෙහිව දැවැන්ත ජන අරගලයක් දියත් කිරීමට මේ දින වල සූදානම් වෙයි. පහත් බිම් හා වෙල් ආශ්‍රිත ප්‍රදේශ ගොඩෙ කිරීම සම්බන්ධයෙන් දැඩි ක්‍රියා මාර්ග ගන්නා බවට පසුගිය ගංවතුර සමයේදී ආණ්ඩුවත්, ජනාධිපතිවරයාත් කුමන පුරසාරම් දෙඩුවද, ඒවා පුස් වෙඩිල්ලක් කරමින් ව්‍යාපාරිකයෝ හා මුදලාලිලා මේ දිනවල බැකෝ, ඩෝසර් හා ටිපර් රථ යොදා ගජරාමෙට ජලය බැසයන ප්‍රදේශ ගොඩකර වසා දැමීම මුල්ලේරියාව හා අංගොඩ යන ප්‍රදේශවල නිතර දක්නට ලැබෙන්නෙකි. මේ හේතුව නිසා සිදුවන ගංවතුරක භායානක කම ආණ්ඩුවට හා ජනතාවට අවබෝධ කරවනු වස් ඊට විරුද්ධව කොළොන්නාව මැතිවරණ කොට්ඨාශයපුරා ජන අරගල දියත් කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් සූදානම් බව කොළොන්නාව ප්‍රජාතන්තවාදී වාමාංශික පෙරමුණේ ප්‍රධාන සංවිධායක මාධ්‍යවේදී වෙලිටන් කහඳවලආරච්චි පවසයි.

### කසල ව්‍යාපෘතිය ජනතාවට හිරිහැර

මහ නුවර නගරයේ දළදා වීදයේ පිහිටි ජෝජෝදී ද සිල්වා වෙළඳ සංකීර්ණයේ ඉදිරිපිට සවිකිරීමට යෝජනා කර ඇති කසල ජල ව්‍යාපෘතිය නිසා වෙළඳ සංකීර්ණයට විශාල අවහිරයක් පවති. කොරියන් සමාගමට නගර සභාව මගින් කොන්ත්‍රාත් භාර දී ඇති මෙම වැඩ පිළිවෙල නිසා වෙළඳ සංකීර්ණයේ වෙළදාම් කරගෙන යන වෙළඳසල් වලට ඉතාමත්ම අවහිරයක් ඇති වී තිබේ. මේ පිළිබඳ නගර සභාව දැනුවත්කර ඇතත් තවම විසඳුමක් ලැබී නැත. වෙළඳ සංකීර්ණයට ඇතුලු වීමට පිය ගැටපෙළවල් අවහිර කර මෙම ව්‍යාපෘතියෙහි වැට සවිකර ඇත. එම නිසා දෙනෝ දහක් ජනයා යන එන මෙම ස්ථානය ජනතාවට ඉතාම ඉක්මනින් විවෘත කර දෙන ලෙසත්, කසල ව්‍යාපෘතිය වෙත් තැනකට ගෙනයන ලෙසට ඉල්ලා ඇති බවට වාර්ථා වේ.

මහනුවර - ගාමිණි චන්ද්‍රරත්න -

කොළඹ 10, ස්ටාර් මුද්‍රණාලයේ දී මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි